C
491.37
RAH

# සද්දසාරත්ථජාලිනී

(පෙළ සංස්කරණය, අන්වය, අර්ථය හා

හැඳින්වීම)

පේරාදෙණිය විශ්වවිද්‍යාලය වෙත ආචාර්ය

උපාධිය සඳහා ඉදිරිපත්කරනු ලබන

ස්වාධීන නිබන්ධය -2008

කොටපිටියේ රාහුල හිමි

ලි.ප.අං. GS/Ph.D/98/03

628251

UNIVERSITY OF PERADENIYA
3 AUG 2009
LIBRARY

# ග්‍රන්ථ සාරාංශය

පාලි පද්‍යයෙන් රචිත එකම ව්‍යාකරණ ග්‍රන්ථය වන සද්දසාරත්ථජාලිනියෙහි සද්දසාර හා අර්ථසාර යනුවෙන් ප්‍රධාන පරිච්ඡේද ද්වයක් ද සන්ධි, නාම, කාරක, සමාස, තද්ධිත, ආඛ්‍යාත හා කිතක යනුවෙන් පරිච්ඡේද හතක් ද ඇතුළත්ය. සද්දසාර හා අර්ථසාර කාණ්ඩවල ථෙරවාදි බෞද්ධ න්‍යාය ද බුදුසමයාගත ඇතැම් කරුණු ද නිදර්ශන ද ඇතුළත්ය. සෙසු පරිච්ඡේදවල ද කිසියම් ප්‍රමාණයක් ඒවා දක්නට ලැබේ.

මෙම කරුණු ඇතුළත් මූලික පෙළ සංස්කරණය කිරීමත් අන්වය හා අර්ථය ප්‍රකට කිරීමත් මෙම ග්‍රන්ථයෙහි ඇතුළත්ය. ඒ සඳහා යොදාගන්නා ලද විවිධ සංස්කරණවල සටහන් ද නිර්දේශ ද මෙහි ඇතුළත් කළෙමි.

ග්‍රන්ථ සංස්කරණයෙන් අනතුරුව මේ පිළිබඳව කෙරෙන හැඳින්වීම ග්‍රන්ථයෙහි මුලට යොදා ඇත. එහි සංස්කරණය සඳහා යොදගන්නා ලද පුස්කොළ පිටපත් සහ මුද්‍රිත පිටපත් පිළිබඳ විස්තර, ග්‍රන්ථ කර්තෘ, කාලය, අරමුණ සහ ඓතිහාසික පසුබිම ද පිටපත් සොයා ගැනීමේ දී හා පිටපත් සංසන්දනය කිරීමේ දී මුහුණ පාන්නට සිදුවූ දුෂ්කරතා හා පහසුකම් ආදිය ද පිටපත් සන්සන්දනය කර නිවැරදි පාඨ තේරීමේ දී අනුගත ක්‍රමවේදය ද ඒ සඳහා යොදන ලද නිදර්ශන ද ග්‍රන්ථයේ අන්තර්ගතය හා විෂය ක්ෂේත්‍ර ද ග්‍රන්ථ රචනයේ දී භාවිත කොට ඇති මූලාශ්‍ර පිළිබඳ හැඳින්වීම ද ග්‍රන්ථයේ විශේෂතා සහ දුර්වලතා ඉදිරිපත් කිරීම ද මෙම පර්යේෂණයේ දී සිදුකළෙමි. ග්‍රන්ථාවසානයෙහි මෙම පර්යේෂණය සඳහා යොදාගත් සිංහල සහ ඉංග්‍රීසි ග්‍රන්ථ සහ සඟරා නාමාවලියක් ද අන්තර්ගතය.